පාර්ලිමේන්තුවේ පුස්තකාලයේ
1980 -12- 22

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 32 දරන
# විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතන පනත

---

[සහතිකය සටහන් කළේ 1980 අගෝස්තු 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 ඔක්තෝබර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල: ශත 90 යි

තැපැල් ගාස්තුව: ශත 35 යි

# 1980 අංක 32 දරන විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතන පනත

[සහතිකය සටහන් කළේ 1980 අගෝස්තු මස 26 වන දින]

එල්. ඩී.—ඕ. 38/78.

විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාර කටයුතු කර ගෙන යාම විධිමත් කිරීම පිණිස ද ඒ ව්‍යාපාර කටයුතු කරගෙන යන තැනැත්තන් විසින් විදේශ සේවා නියුක්තිය සඳහා තැනැත්තන් බඳවා ගැනීම විධිමත් කිරීම පිණිස ද 1956 අංක 37 දරන ගාස්තු අයකරන සේවා නියුක්ති නියෝජ්‍යායතන පනත සංශෝධනය කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.*

1. මේ පනත 1980 අංක 32 දරන විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

*විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතන සඳහා බලපත්‍ර ලබා ගත යුතු බව.*

2. (1) යම් තැනැත්තෙක් මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නෙක් වේ නම් ද ඒ බලපත්‍රයේ සඳහන් නියම හා කොන්දේසිවලට අනුකූලව ද මිස, විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාර කටයුතු ඒ තැනැත්තා විසින් කරගෙන යනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, නියමිත දිනයෙහි 1956 අංක 37 දරන ගාස්තු අය කරන සේවා නියුක්ති නියෝජ්‍යායතන පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය මත විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාර කටයුතු කරගෙන යන තැනැත්තකු විසින්, ඒ ව්‍යාපාර කටයුතු—

(අ) නියමිත දිනයෙන් පසුව දවස් තිහක කාලයක් ඉකුත් වන තෙක්; හෝ

(ආ) නියමිත දිනයෙන් පසුව දවස් තිහක කාලය ඇතුළත ඔහු විසින් මේ පනත යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක, ඒ ඉල්ලුම් පත්‍රය පිළිබඳව තීරණයක් කරන තෙක් හෝ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අභියාචනය කළ හැකි කාලසීමාව ඉකුත් වන තෙක් හෝ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අභියාචනයක් කරනු ලැබූ අවස්ථාවක ඒ අභියාචනය පිළිබඳව තීරණයක් කරන තෙක්

කරගෙන යා හැකි ය.

ඒ 49477-10,200 (80/05)

මේ පනත අදාළ වීම.

3. (1) අවශ්‍ය විය හැකි යම් නිලධරයන්ගේ සහාය ඇතිව කොමසාරිස්වරයා මගින් යම් විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ද කොමසාරිස්වරයා විසින් සලසන ලද යම් සේවයක් සඳහා අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි යම් ගාස්තු අය කිරීමට ද රජයට හිමිකම තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන හැර මේ පනතේ විධිවිධාන රජයට සහ රජය සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(3) විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාර කටයුතු කරගෙන යාමට කිසිම රාජ්‍ය සංස්ථාවකට හිමිකම නොතිබිය යුතු ය.

බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම.

4. (1) බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් කොමසාරිස්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර, පහත දැක්වෙන විස්තර එහි ඇතුළත් විය යුතු ය:—

(අ) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය;

(ආ) ඉල්ලුම්කරු පුද්ගලයෙක් ද, ව්‍යාපාරික ආයතනයක් ද නැත හොත් සමාගමක් ද යන වග;

(ඇ) ඉල්ලුම්කරු—

(i) පුද්ගලයෙක් නම්, ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන වග;

(ii) ව්‍යාපාරික ආයතනයක් නම්, එහි හවුල්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ද යන වග;

(iii) සමාගමක් නම්, සමාගමේ ප්‍රාග්ධනයේ කොටස්වලින් වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් දරනු ලබන්නේ ද යන වග;

(ඈ) ඉල්ලුම්කරු ව්‍යාපාරික ආයතනයක් නම් හෝ සමාගමක් නම් ව්‍යාපාරය භාරව සිටීමට නියමිත තැනැත්තාගේ සම්පූර්ණ නම සහ ලිපිනය;

(ඉ) ඉල්ලුම්කරු පුද්ගලයෙක් නම්, ඔහු මනා පැවැත්මෙන් යුත් තැනැත්තකු ද යන වග;

(ඊ) ඉල්ලුම්කරු ව්‍යාපාරික ආයතනයක් හෝ සමාගමක් හෝ වන අවස්ථාවක, ව්‍යාපාරය භාරව සිටීමට නියමිත තැනැත්තා මනා පැවැත්මෙන් යුත් තැනැත්තකු ද යන වග;

(උ) ව්‍යාපාරය කරගෙන යාමට නියමිත ස්ථානයේ ලිපිනය, ඒ ස්ථානයේ ගෙබිමෙහි වර්ග ප්‍රමාණය සහ ඒ ස්ථානයේ ඇති පහසුකම්.

(2) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ හෝ (ඊ) ඡේදයේ සඳහන් විස්තර, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරුගේ හෝ ව්‍යාපාරය භාරව සිටීමට නියමිත තැනැත්තාගේ හෝ චරිතය සහ පැවැත්ම පිළිබඳව මෑත දී ලබාගත් සහතික දෙකක් මගින් සනාථ කරනු ලැබිය යුතු ය.

5. (අ) ඉල්ලුම්කරු—

(i) පුද්ගලයෙක් නම්, ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වුව හොත් මිස ;

(ii) ව්‍යාපාරික ආයතනයක් නම්, එහි හවුල්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් වුවහොත් මිස ; හෝ

(iii) සමාගමක් නම්, ඒ සමාගමේ ප්‍රාග්ධනයේ කොටස් වලින් වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් දරනු ලැබුවහොත් මිස ; සහ

(ආ) ඉල්ලුම්කරු පුද්ගලයෙක් නම්, ඒ පුද්ගලයා ද, ව්‍යාපාරික ආයතනයක් හෝ සමාගමක් සම්බන්ධයෙන් වන විට එහි ව්‍යාපාරය භාරව සිටීමට නියමිත තැනැත්තා ද මනා පැවැත්මෙන් යුක්ත වුවහොත් මිස ; සහ

(ඇ) ඒ ව්‍යාපාරය කරගෙන යාමට නියමිත ස්ථානය පිහිටා ඇති ප්‍රදේශය, එහි විශාලත්වය සහ ඒ ස්ථානයේ ඇති පහසුකම් සැලකිල්ලට ගෙන, ඒ ස්ථානය ඒ ව්‍යාපාරය කරගෙන යාමට යෝග්‍ය වුවහොත් මිස

ඔහුට බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

බලපත්‍රයක් නිකුත් කිරීමට අදාළ කොන්දේසි.

6. (1) බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර—

(අ) (i) සදාචාරාත්මක හෝ අන්‍යාකාර දෝෂ දර්ශනයකට භාජන කළ නොහැකි ආකාරයෙන් ව්‍යාපාරය කරගෙන යන බවට ; සහ

(ii) බලපත්‍රය ඉල්ලුම් කරනු ලබන්නේ යම් විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතනයක් සම්බන්ධයෙන් ද ඒ ආයතනය විසින් විදේශ සේවා නියුක්තිය සඳහා බඳවා ගනු ලබන තැනැත්තකු සමග විදේශීය සේවා යෝජකයකු ඇතුළත් විය යුතු සේවා නියුක්ති ගිවිසුම යටතේ ඒ විදේශීය සේවායෝජකයා මිනා පැවරෙන නියම හා කොන්දේසි, ඒ සේවායෝජක විසින් පිළි පදින බවට වගබලා ගැනීම පිණිස සාධාරණ ලෙස හැකි සියලු පියවර ගන්නා බවට

කොමසාරිස්වරයා සමග එකඟවීමකට ඇතුළත් වන ලෙස ;

(ආ) ව්‍යාපාරය හා සම්බන්ධව හෝ (අ) ඡේදයෙහි සඳහන් යම් සේවා නියුක්ති ගිවිසුමක් හා සම්බන්ධව හෝ උද්ගත විය හැකි හිමිකම් පෑම් පියවීම සඳහා, කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි රුපියල් එක්ලක්ෂයකට නො අඩු මුදල් ප්‍රමාණයක, ඇපකරුවන් දෙදෙනකුගෙන් සමන්විත බැඳුම්කරයකට කොමසාරිස්වරයා සමග ඇතුළත් වන ලෙස ; සහ

(ඇ) බලපත්‍රය සඳහා නියමිත ගාස්තුව ගෙවන ලෙස

කොමසාරිස්වරයා විසින් ඉල්ලුම්කරුට විධාන කළ යුතු ය.

බලපත්‍රය නිකුත් කිරීමට පෙර ඉල්ලුම් කරු විසින්, කොමසාරිස් වරයා විසින් නිකුත් කරන ලද විධාන අනුව ක්‍රියා කළ යුතු බව.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන අනුව ක්‍රියා කිරීමට ඉල්ලුම්කරු අපොහොසත් වන අවස්ථාවක, ඔහුට බලපත්‍රයක් නිකුත් කිරීම කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

බලපත්‍රයේ ආකෘතිය සහ එය බලපවත්නා කාලය.

7. සෑම බලපත්‍රයක් ම—

(අ) නියමිත ආකෘතියෙහි විය යුතු ය ; නවද

(ආ) කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, එය නිකුත් කරනු ලැබූ දින සිට මාස දොළහක කාලයක් තුළ බලපැවැත්විය යුතු ය.

බලපත්‍රය අලුත් කිරීම.

8. බලපත්‍රයක කාලය ඉකුත්වීමට පෙර එක් මාසයක කාලසීමාවක් ඇතුළත කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලුම් පත්‍රයක් මත කොමසාරිස්වරයා විසින්—

(අ) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන හෝ බලපත්‍රලාභියා මේ පනත යටතේ ඇතුළත් වී ඇති යම් එකඟවීමක හෝ බැඳුම්කරයක විධිවිධාන හෝ බලපත්‍රලාභියා විසින් පිළිපැද ඇති බවට නැතහොත් බලපත්‍රලාභියා මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ යම් වරදකට වරදකරු කර නොමැති බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වන්නේ නම් ; සහ

(ආ) බලපත්‍රය අලුත් කිරීම සඳහා නියමිත ගාස්තුව බලපත්‍රලාභියා විසින් ගෙවනු ලැබුවහොත්

එක් වරකට අවුරුද්දකට වැඩි නොවන කාලසීමාවක් හෝ කාලසීමා සඳහා බලපත්‍රයක් අලුත් කරනු ලැබිය හැකි ය.

බලපත්‍රයක් අවලංගු කිරීම.

9. (1) බලපත්‍රලාභියා—

(i) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක හෝ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් නැතහොත් බලපත්‍රලාභියා මේ පනත යටතේ ඇතුළත් වී ඇති යම් එකඟවීමක හෝ බැඳුම්කරයක විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් කඩ කර ඇති බවට ;

(ii) මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ වරදකට වරදකරු කරනු ලැබ ඇති බවට ;

(iii) 20 වන වගන්තිය හෝ 22 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද යම් විධාන අනුව ක්‍රියා කර නොමැති බවට ; හෝ

(iv) බලපත්‍රලාභියා විසින් මේ පනත යටතේ යවන ලද යම් ඉල්ලුම් පත්‍රයක හෝ වාර වාර්තාවක හෝ ලිඛිත තොරතුරක නැතහොත් ලිඛිත කරුණු පැහැදිලි කිරීමක, තමාගේ දැනීම අනුව අසත්‍ය හෝ සාවද්‍ය විස්තර කිසිවක් සපයා ඇති බවට

කොමසාරිස්වරයා සෑහීමට පත් වන්නේ නම් කොමසාරිස්වරයා විසින් යම් බලපත්‍රයක් අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම, කොමසාරිස්වරයාගේ තීරණයට විරුද්ධව අභියාචනා කිරීම සඳහා නියමිත කාලය ඉකුත්වන තෙක් හෝ අභියාචනයක් කර ඇත් නම්, අභියාචනය අසා නිම වන තෙක් හෝ බලාත්මක නොවිය යුතු ය.

10. බලපත්‍රයක් ප්‍රදානය කිරීම නැතහොත් අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ බලපත්‍රයක් අවලංගු කිරීමට හෝ කොමසාරිස්වරයා තීරණය කළ අවස්ථාවක, ඒ තීරණය, ඊට හේතු ද සහිතව, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරුට හෝ බලපත්‍රලාභියාට හෝ කොමසාරිස්වරයා විසින් දැනුම් දෙනු ලැබිය යුතු ය. කොමසාරිස්වරයා විසින් ස්වකීය තීරණය, ඊට හේතු ද සහිතව, ඉල්ලුම්කරුට හෝ බලපත්‍රලාභියාට දැනුම් දිය යුතු බව.

11. (1) (අ) බලපත්‍රයක් ප්‍රදානය කිරීම නැතහොත් අලුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් ; හෝ අභියාචනා.

(ආ) බලපත්‍රය අවලංගු කරමින්

කොමසාරිස්වරයා විසින් කරන ලද තීරණයකින් අතෘප්තියට පත්, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරු හෝ බලපත්‍රලාභියා හෝ විසින්, ඒ තීරණයට විරුද්ධව, ඒ තීරණය ඔහුට දැනුම් දෙනු ලැබූ දින සිට දවස් දහහතරක් ඇතුළත අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් අභියාචනයක් කරනු ලැබූ විට, ඒ ලේකම්වරයා විසින්—

(අ) අභියාචනයට ඉඩ දී, බලපත්‍රයක් ප්‍රදානය කරන ලෙස හෝ අලුත් කරන ලෙස කොමසාරිස්වරයාට විධාන කළ හැකි ය ; නැතහොත්

(ආ) අභියාචනයට ඉඩ දීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා වෙත නිකුත් කරනු ලබන කවර වූ හෝ විධානයක් අනුව ඔහු ක්‍රියා කළ යුතු ය.

12. බලපත්‍රලාභියා විසින් ව්‍යාපාරය කරගෙන යනු ලබන්නේ යම් ස්ථානයක ද ඒ ස්ථානයෙහි ඔහු වෙත ප්‍රදානය කර ඇති බලපත්‍රය, ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කළ යුතු ය. බලපත්‍රය ප්‍රදර්ශනය කිරීම.

13. බලපත්‍රලාභියා විසින් සලසනු ලබන යම් සේවා සඳහා, ඒ සේවා වෙනුවෙන් නියමිත ගාස්තුව ඉක්මවන ගාස්තුවක් ඔහු විසින් කෙළින්ම හෝ අන් අයුරකින් හෝ අය කරනු නොලැබිය යුතු ය. සේවා සඳහා අය කරනු ලබන ගාස්තුව නියමිත ගාස්තුව නො ඉක්මවිය යුතු බව.

විස්තරවල යම් වෙනසක් බලපත්‍රලාභියා විසින් කොමසාරිස්වරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු බව.

14. (1) බලපත්‍රලාභියකු විසින්, බලපත්‍රයක් සඳහා තමා විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයේ ප්‍රකාශිත විස්තරවල යම් වෙනසක් සිදුවී දවස් තිහක් ඇතුළත, ඒ වෙනස පිළිබඳව, කොමසාරිස්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ ඇතුළත් කිසිවකින්, බලපත්‍රයේ සඳහන් නියම හා කොන්දේසිවලට අනුකූලව හැර අන්‍යාකාරයකින් යම් ව්‍යාපාරයක් කරගෙන යාමට, බලපත්‍රලාභියාට බලය නොපැවරෙන්නේ ය.

කොමසාරිස්වරයාගේ අනුමතය නොමැතිව බඳවා ගැනීම සම්බන්ධයෙන් කිසිම ක්‍රියාවක් නොකළ යුතු බව.

15. (1) බලපත්‍රලාභියකු විසින් කොමසාරිස්වරයාගේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව, විදේශ සේවා නියුක්තිය සඳහා තැනැත්තන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවන යම් ප්‍රචාරක දැන්වීමක් නිකුත් කිරීම හෝ දැන්වීමක් නිකුත් කිරීම හෝ ඒ සේවා නියුක්තිය හා සම්බන්ධව නැතහොත් ඊට ආනුෂංගිකව වෙනත් යම් ක්‍රියාවක් කිරීම හෝ නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයාගේ අනුමතය ලබා ගැනීමේ කාර්යය සඳහා, බලපත්‍රලාභියා විසින් පහත සඳහන් විස්තර, කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:—

(අ) විදේශීය සේවා යෝජකයාගේ නම සහ ලිපිනය;

(ආ) තැනැත්තන් බඳවා ගැනීම සඳහා, විදේශීය සේවා යෝජක සමඟ බලපත්‍රලාභියා ඇතුළත් වී ඇති ගිවිසුමේ හෝ එකඟ වීමේ පිටපතක්;

(ඇ) තැනැත්තන් බඳවා ගනු ලබන්නේ යම් සේවා නියුක්තියක් සඳහා ද ඒ සේවා නියුක්තියේ ස්වභාවය;

(ඈ) විදේශීය සේවා නියුක්තිය සඳහා බඳවා ගැනීමට නියමිත තැනැත්තන්ට සේවා යෝජක විසින් පිරිනමන වේතන, නිවාඩු, වැඩ කරන වේලාවන් සහ ශ්‍රී ලංකාවෙන් යාම හා ශ්‍රී ලංකාවට ආපසු ඒම සඳහා වූ යානපත්‍ර පිළිබඳ නියම හා කොන්දේසි ඇතුළුව සේවා නියුක්තිය පිළිබඳ නියම හා කොන්දේසි; සහ

(ඉ) නියම කරනු ලැබිය හැකි යම් වැඩිදුර විස්තර.

(3) (2) වන උපවගන්තිය යටතේ සපයන ලද විස්තර ප්‍රමාණවත් නොවන අවස්ථාවක, අවශ්‍ය යයි තමා සලකන යම් අමතර විස්තර සපයන ලෙස කොමසාරිස්වරයා විසින් නියම කළ හැකි ය.

(4) තැනැත්තන් බඳවාගනු ලබන්නේ යම් සේවා නියුක්තියක් සඳහා ද ඒ සේවා නියුක්තියේ ස්වභාවය ආත්ම ගෞරවය කෙලෙසන බවට හෝ අමානුෂික බවට හෝ, තැනැත්තන් සේවයෙහි නියුක්ත කිරීමේ සාමාන්‍ය ප්‍රමිති අනුව සලකා බලන කල, ඒ සේවා නියුක්තියෙහි නියමයන් සහ කොන්දේසි අසාධාරණ බවට හෝ කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ අනුමතය දීම කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය.

(5) (2) වන සහ (3) වන උපවගන්ති යටතේ කොමසාරිස්වරයා වෙත සපයන ලද තොරතුරු කිසිවක්, මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධරයන්ට හෝ යම් අධිකරණයකට හෝ හැර, අන් කිසිම තැනැත්තකුට බලපත්‍රලාභියාගේ කැමැත්ත ඇතිව මිස, කොමසාරිස්වරයා විසින් හෙළිදරව් කරනු නොලැබිය යුතු ය.

විදේශ සේවා නියුක්තිය සඳහා බඳවා ගැනීම පිණිස තැනැත්තන් සම්මුඛ පරීක්ෂණවලට භාජන කිරීමේ දී බලයලත් නිලධරයකුට පැමිණ සිටිය හැකි බව.

**16.** මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන පිළිපැදීම සහතික කිරීමේ කාර්යය සඳහා විදේශ සේවා නියුක්තිය සඳහා යම් තැනැත්තකු බඳවා ගැනීම පිණිස බලපත්‍රලාභියකු විසින් පවත්වනු ලබන යම් සම්මුඛ පරීක්ෂණයක දී, ඊට පැමිණ සිටීමේ කාර්යය සඳහා කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ නිලධරයකුට ඊට පැමිණ සිටිය හැකි අතර, එසේ පැමිණ සිටීමට ඒ නිලධරයාට සියලු පහසුකම් සැලසීම, ඒ බලපත්‍රලාභියාගේ යුතුකම විය යුතු ය.

අනුමතය දෙනු නොලැබිය හැකි හේතු.

**17.** (1) (i) කොමසාරිස්වරයාගේ මතය අනුව—

(අ) යම් පංතියක හෝ වර්ගයක තැනැත්තන්ගේ සේවාවන් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට පරම විශයෙන් අවශ්‍ය වන්නේ නම්; හෝ

(ආ) යම් පංතියක හෝ වර්ගයක තැනැත්තන්ගේ සේවාවන් සඳහා පවත්නා හා අපේක්ෂිත ඉල්ලුම කෙරෙහි සැලකිල්ල ඇතිව, ඒ පංතියේ හෝ වර්ගයේ තැනැත්තන් ශ්‍රී ලංකාවෙන් පිටත්වීමෙන් ජාතික ආර්ථිකයට අහිතකර අන්දමින් බල පාන්නේ නම්; හෝ

(ඇ) යම් පංතියක හෝ වර්ගයක තැනැත්තන්ගේ දක්ෂතා කෙරෙහි සැලකිල්ල ඇතිව, ඔවුන්ට දෙන ලද සේවා නියුක්ති නියමයන් සහ කොන්දේසි සතුටුදායක නොවේ නම්; හෝ

(ii) සේවා නියුක්තිය දෙනු ලැබූ රටෙහි නීතිය මගින් ඒ සේවා නියුක්තිය, විධිමත් කරනු නොලැබුවේ නම්

විදේශ සේවා නියුක්තිය සඳහා ඒ පංතියේ හෝ වර්ගයේ තැනැත්තන් බඳවා ගැනීම අනුමත කිරීම කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය.

(2) විදේශ සේවා නියුක්තිය සඳහා යම් පංතියක හෝ වර්ගයක තැනැත්තන් බඳවා ගැනීම අනුමත කිරීම ප්‍රතික්ෂේප කෙරෙන කොමසාරිස්වරයාගේ තීරණයකින් අතෘප්තියට පත් බලපත්‍රලාභියකු විසින්, ඒ තීරණයට විරුද්ධව, ඒ තීරණය ඔහුට දැනුම් දෙනු ලැබූ දින සිට දවස් දහහතරක් ඇතුළත අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කරන ලද යම් අභියාචනයක් මත, ඒ ලේකම්වරයා විසින්—

(අ) අභියාචනයට ඉඩ දෙනු ලැබිය හැකි අතර, අභියාචනය අදාල වන්නේ යම් පංතියක හෝ වර්ගයක තැනැත්තන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ද ඒ පංතියේ හෝ වර්ගයේ තැනැත්තන් බඳවා ගැනීම අනුමත කරන ලෙස කොමසාරිස්වරයාට විධාන කරනු ලැබිය හැකි ය; නැතහොත්

(ආ) අභියාචනයට ඉඩ දෙනු නොලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ තමා වෙත නිකුත් කරනු ලබන කවර වූ හෝ විධානයක් අනුව කොමසාරිස්වරයා විසින් ක්‍රියා කරනු ලැබිය යුතු ය.

**සේවා නියුක්ති ගිවිසුම.**

18. (1) විදේශීය සේවායෝජක සහ ඒ සේවායෝජක විසින් සේවා නියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ තැනැත්තා අතර වූ සේවා නියුක්ති ගිවිසුම ඒ සේවායෝජක නැතහොත් ඔහුගේ අනුයෝජිතයා විසින් සහ ඒ තැනැත්තා විසින් අත්සන් කිරීමට ප්‍රථම, ඒ තැනැත්තාට වැටහෙන භාෂාවකින් කියවා පැහැදිලි කර දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ගිවිසුම අත්සන් තැබූ වහාම ඒ ගිවිසුමේ පිටපත් දෙකක්, ඒ සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පිටත්ව යාමට කලින්, කොමසාරිස්වරයා විසින් සහතික කරනු පිණිස, බලපත්‍රලාභියා විසින් හෝ ඒ අනුයෝජිතයා විසින් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ඒ ගිවිසුමේ පිටපත්, (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කොමසාරිස්වරයා විසින් සහතික කරනු ලැබූ වහාම, ඒ බව ඔහු විසින් ඒ බලපත්‍රලාභියාට හෝ අනුයෝජිතයාට හෝ දැනුම් දිය යුතු අතර, ලියාපදිංචි කරනු පිණිස, ඉන් එක් පිටපතක් විදේශීය සේවායෝජකගේ රටෙහි කම්කරු අමාත්‍යාංශය වෙත කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**වාර්තා පවත්වා ගෙන යාම.**

19. සෑම බලපත්‍රලාභියකු විසින් ම, නියම කරනු ලබන වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

**වාර වාර්තා.**

20. (1) කොමසාරිස්වරයා විසින්, ලියවිල්ලකින් වූ යම් විධානයක් මගින්, ඒ විධානයෙහි සඳහන් දිනයට පෙර—

(අ) බලපත්‍රලාභියා විසින් පවත්වා ගෙන යනු ලබන විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතනයේ ව්‍යාපාරික කටයුතු හා සම්බන්ධව, කොමසාරිස්වරයාට අවශ්‍ය විය හැකි යම් විස්තර ඇතුළත් වාර වාර්තාවක්;

(ආ) බලපත්‍රලාභියා විසින් විදේශ සේවානියුක්තිය සඳහා යම් තැනැත්තකු බඳවා ගනු ලබන්නේ යම් සේවායෝජකයකු වෙනුවෙන් ද ඒ සේවා යෝජක විසින් ගෙවිය යුතු කොමිස් මුදල ශ්‍රී ලංකාවේ බැංකුවකට ප්‍රේෂණය කළ බවට සාක්ෂි; සහ

(ඇ) බලපත්‍රලාභියා විසින් එවන ලද යම් වාර වාර්තාවක ප්‍රකාශිත යම් විස්තර සම්බන්ධයෙන් කොමසාරිස්වරයාට අවශ්‍ය විය හැකි යම් ලිඛිත තොරතුරු හෝ යම් ලිඛිත පැහැදිලි කිරීම්

තමා වෙත එවන ලෙස ඕනෑම වේලාවක දී, බලපත්‍රලාභියකුට නියම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විධානයක් නිකුත් කරනු ලැබුවේ යම් බලපත්‍රලාභියකු වෙත ද ඒ බලපත්‍රලාභියා විසින්, ඒ විධානයෙහි සඳහන් කළ යුතු කාලය ඇතුළත ඒ විධානය අනුව ක්‍රියා කළ යුතු ය.

ඇතුළ් වී පරීක්ෂා කිරීමේ බලතල.

21. (1) කොමසාරිස්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින්—

(අ) මේ පනතේ සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන අනුව ක්‍රියා කරනු ලබන්නේ දැයි නිසැකව දැන ගැනීමේ කාර්යය සඳහා බලපත්‍රලාභියකු විසින් විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාර කටයුතු කර ගෙන යනු ලබන ස්ථානයකට, දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ ඕනෑම යුක්තිසහගත වේලාවක දී ඇතුළු වී එය පරීක්ෂා කිරීම ; සහ

(ආ) ඒ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් තබා ගැනීමට මේ පනතින් හෝ මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයකින් හෝ නියෝගයක් යටතේ නියම කර ඇති යම් වාර්තා පරීක්ෂා කිරීම සහ ඒවායේ පිටපත් ගැනීම

කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීමෙහි ලා කොමසාරිස්වරයාට හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට හෝ බාධා කරන නැත හොත් කොමසාරිස්වරයා හෝ ඒ තැනැත්තා ප්‍රමාද කරවන සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

කොමසාරිස්වරයාගේ විධාන.

22. බලපත්‍රලාභියකු ලවා මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන අනුව ක්‍රියා කරවීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි කොමසාරිස්වරයා කල්පනා කරන යම් විධාන, ඔහු විසින් බලපත්‍රලාභියකු වෙත නිකුත් කළ හැකි අතර එවැනි යම් විධානයක් නිකුත් කරනු ලැබුවේ යම් බලපත්‍රලාභියකු වෙත ද ඒ බලපත්‍රලාභියා විසින් ඒ විධානයෙහි සඳහන් යම් කාලයක් ඇතුළත දී ඒ විධාන අනුව ක්‍රියා කළ යුතු ය.

විදේශ සේවා නියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ තැනැත්තන් විසින් කරනු ලබන පැමිණිලි විභාග කිරීම.

23. (1) විදේශ සේවා නියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ හෝ විදේශයක සේවයෙහි නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තකුගෙන්—

(අ) තමා පිළිබඳ වූ සේවා නියුක්ති ගිවිසුමෙන් සේවායෝජක වෙත පැවරී ඇති නියම හා කොන්දේසි ඒ සේවායෝජක විසින් පිළිපැද නොමැති බවට ; සහ

(ආ) විදේශ සේවා නියුක්තිය සඳහා තමා බඳවා ගත් බලපත්‍රලාභියා 6(1) (අ) වගන්තිය යටතේ කොමසාරිස්වරයා සමග ඇතුළත් වූ එකඟවීම කඩ කරමින්, ඒ බලපත්‍රලාභියා විසින්, ඒ නියම හා කොන්දේසි සේවා යෝජක විසින් පිළිපදිනු ලබන බවට වගබලා ගැනීමට සාධාරණ ලෙස හැකි පියවර ගැනීම පැහැර හැර ඇති බවට

පැමිණිල්ලක් කොමසාරිස්වරයාට ලැබුණු අවස්ථාවක, අවශ්‍ය යයි කොමසාරිස්වරයා සලකන යම් විභාගයකින් පසු සේවායෝජක ඒ කොන්දේසි කඩ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකාවට පැමිණීමේ යානපත්‍ර ගාස්තු ඇතුළුව, ඒ තැනැත්තා දරන්නට සිදු වූ වියදම් පියවීම සඳහා ප්‍රමාණවත් යයි, කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක් ඒ තැනැත්තාට ගෙවන ලෙස, කොමසාරිස්වරයා විසින් බලපත්‍රලාභියාට විධාන කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පවත්වනු ලබන යම් විභාගයක දී කොමසාරිස්වරයා විසින්, ආවේදිත පාර්ශ්වකරුවන්ට කරුණු කියා සිටීමට අවස්ථාවක් ලබා දිය යුතු ය.

නියෝග.

24. (1) නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇත්තේ යම් කාරණයක් සම්බන්ධයෙන් ද ඒ කාරණය සම්බන්ධයෙන් හෝ නියම කළ යුතු යයි මේ පනතින් නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක හෝ, ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, ඒ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු, හැකි පහසු ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක්, එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

වැරදි.

25. (අ) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක හෝ යම් විධිවිධාන කඩ කරන; හෝ

(ආ) තමාගේ දැනීම අනුව අසත්‍ය සහ සාවද්‍ය විස්තර ඇතුළත් යම් වාර වාර්තාවක්, ලිඛිත තොරතුරු හෝ ලිඛිත පැහැදිලි කිරීම් හෝ සපයන,

සෑම තැනැත්තකු ම වරදකට වරදකරු වියයුතු අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස දහඅටක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

26. මේ පනත යටතේ වූ යම් වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක— *පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන වැරදි.*

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ වරද සිදු කරනු ලබන අවස්ථාවේ දී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂකවරයකුව හෝ නිලධරයකුව හෝ සිටි සැම තැනැත්තකු ම; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවන පුද්ගල මණ්ඩලයක් නම් ඒ වරද සිදු කරනු ලැබූ අවස්ථාවේ දී ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකුව සිටි සැම තැනැත්තකු ම

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුවද ඒ වරද සිදු කරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව බව හෝ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව හෝ ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ සාමාජිකයා විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ සාමාජිකයා ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

27. (1) 1956 අංක 37 දරන ගාස්තු අය කරන සේවා නියුක්ති නියෝජ්‍යායතන පනතේ 8 වන වගන්තිය, මෙයින් ඉවත් කරනු ලැබේ. *1956 අංක 37 දරන ගාස්තු අය කරන සේවා නියුක්ති නියෝජ්‍යායතන පනත සංශෝධනය කිරීම.*

(2) 1956 අංක 37 දරන ගාස්තු අය කරන සේවා නියුක්ති නියෝජ්‍යායතන පනතේ 19 වන වගන්තියේ "ගාස්තු අය කරන සේවා නියුක්ති නියෝජ්‍යායතනය" යන්නෙහි අර්ථකථනය වෙනුවට, මෙහි පහත දක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

' "ගාස්තු අය කරන සේවා නියුක්ති නියෝජ්‍යායතනය" යන්නෙන්, සේවා යෝජකයකුගෙන් හෝ සේවකයකුගෙන් හෝ යම් මුදල් හෝ වෙනත් ද්‍රව්‍යමය වාසියක් (ඒ වාසිය ලාභ වශයෙන් හෝ ගාස්තුවක් වශයෙන් නැතහොත් වෙනත් මුදල් හෝ ද්‍රව්‍යමය වශයෙන් වූ වාසියක් වුව ද) කෙලින් ම හෝ අන් අයුරකින් ලබා ගැනීමේ අරමුණ ඇතිව, සේවකයකුට ශ්‍රී ලංකාවෙහි සේවා නියුක්තිය ලබාදීමේ කාර්යය සඳහා නැතහොත් සේවා යෝජකයකුට ශ්‍රී ලංකාවෙහි සේවයෙහි නියුක්ත කරවීම සඳහා සේවකයකු සැපයීමේ කාර්යය සඳහා අතරමැදියකු ලෙස ක්‍රියා කරන්නා වූ යම් පුද්ගලයෙක්, ව්‍යාපාරික ආයතනයක් හෝ සමාගමක් අදහස් වේ. එහෙත් නාවුකයින් බඳවාගන්නා වූ හෝ හුදෙක් ඉහත කී කාර්යය හා සම්බන්ධ නැතහොත් ප්‍රධාන වශයෙන් ඉහත කී කාර්යය හා සම්බන්ධ ප්‍රවෘත්ති පත්‍රයක් හෝ ප්‍රකාශනයක් නම් මිස, යම් ප්‍රවෘත්ති පත්‍රයක් හෝ වෙනත් ප්‍රකාශනයක් පළ කරන්නා වූ නැතහොත් පළ කිරීමට සලස්වන්නා වූ යම් පුද්ගලයෙක්, ව්‍යාපාරික ආයතනයක් හෝ සමාගමක් ඊට ඇතුළත් නොවේ;'.

අර්ථ නිරූපණය.

28. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාර කට යුතු" යන්නෙන්, (ගාස්තු අයකිරීමෙන් හෝ එසේ නොමැතිව හෝ පවත්වාගෙන යනු ලැබුව ද නොලැබුව ද, වෙනත් යම් ව්‍යාපාරයක් හා සම්බන්ධව පවත්වා ගෙන යනු ලැබුව ද නොලැබුව ද) තැනැත්තන්ට විදේශයන්හි සේවා යෝජකයන් සමග සේවා නියුක්තිය ලබාදීමේ හෝ විදේශයන්හි සේවයෙහි නියුක්ත කිරීම සඳහා විදේශීය සේවා යෝජකයන්ට තැනැත්තන් සපයාදීමේ හෝ කාර්යය සඳහා (තොරතුරු සැපයීමෙන් වුවද අන්‍යාකාරයකින් වුව ද) කරනු ලබන සේවා සැපයීමේ ව්‍යාපාරික කටයුතු අදහස් වන අතර විදේශයන්හි සේවා නියුක්තිය සඳහා තැනැත්තන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවන ප්‍රචාරක දැන්වීමක් හෝ දැන්වීමක් නිකුත් කිරීම හෝ ඒ සේවා නියුක්තිය හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගිකව වෙනත් යම් ක්‍රියාවක් කිරීම හෝ ඊට ඇතුළත් වේ;

"කොමසාරිස්වරයා" යන්නෙන්, තත් කාලයෙහි කම්කරු කොමසාරිස් ධුරය දරන තැනැත්තා අදහස් වන අතර, තත් කාලයෙහි නියෝජ්‍ය හෝ සහකාර කම්කරු කොමසාරිස් ධුරය දරන තැනැත්තා ද ඊට ඇතුළත් වේ;

"සේවායෝජක" යන්නට සේවා යෝජක මණ්ඩලයක් ද ඇතුළත් වේ;

"බලපත්‍රය" යන්නෙන්, මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අදහස් වේ; තවද

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නාවූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් සඳහන් වේ.